**2022.05.25 දින අ.වි.ශි.බ.ම. රුහුණ විශ්වවිද්‍යාලය ඉදිරිපිට පැවැත්වූ විරෝධතාව සම්බන්ධව උපකුලපතිවරයා ගෙන් සමස්ත රුහුණ විශ්වවිද්‍යාලයේ ප්‍රජාවට පණිවිඩයක්**

2022.05.25 දින අ.වි.ශි.බ.ම. රුහුණ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පිවිසුම ඉදිරිපිටදී රුහුණ විශ්වවිද්‍යාලයේ පරිපාලනයට විරෝධය පළකරන ලදී. මීට පෙරද මා විසින් පුරෝකථනය කළ පරිදි, 2018 වසරේ මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පීඨයෙහි ශිෂ්‍ය දර්ශ උදයංගට නවක වදය දීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන මාස හයකට ආසන්න කාලයක් රිමාන්ඩ් භාරයේ සිටි සිසුන් 18 දෙනාට දඬුවම් කිරීමට විරුද්ධවය. මොවුන් සම්බන්ධව ද රුහුණ විශ්වවිද්‍යාලයේ පාලක සභාව මගින් නිතිමය තීරණ ගත් අතර, එම තීරණ ක්‍රියාත්මක කිරිමට එරෙහිව මෙම විරෝධතාවය පැවැත්වූ අතර එය සදාචාරාත්මක වශයෙන් යුක්ති සහගත නොවන අතර එය නීති විරෝධී ලෙස ද සැලකිය හැකිය.

අගතියට පත් පාර්ශවයට මෙම දඬුවම අසාධාරණ යැයි විශ්වාස කරන්නේ නම්, රුහුණ විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ තීරණයට එරෙහිව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභියාචනාධිකරණයේ හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නිතිමය වශයෙන් පමණක් නොව ප්‍රජාතන්ත්‍රවාදීව ද ඔවුන්ට අයිතියක් ඇත. ඔවුන් එසේ නොකර මැර බලය, දේශපාලන බලය පාවිච්චි කරමින් විශ්වවිද්‍යාලයේ විනය අධිකාරියේ තීන්දු තීරණ වෙනස් කරන ලෙස ඉල්ලා මාර්ගයට බැස උද්ඝෝෂණය කරති.. මම අ.වි.ශි.බ.ම. ට මෙය නීත්‍යානුකූලව උසාවියේ අභියෝග කරන ලෙස ඉල්ලා සිටිමි.

2022.05.25 දින අ.වි.ශි.බ.ම රුහුණ විශ්වවිද්‍යාලයේ පරිශ්‍රයට බලහත්කාරයෙන් ඇතුළු වීමට උත්සාහ කළේ උපකුලපතිවරයාට පහර දී රුහුණ විශ්වවිද්‍යාලයේ දේපල වලට හානි කිරීමේ අරමුණින් විය හැකිය. අපගේ නිර්භීත ආරක්ෂක නිලධාරීන් පොලිසියේ මෙන්ම අනෙකුත් කාර්යය මණ්ඩල සාමාජිකයින්ගේ සහාය ඇතිව එම විරෝධතාවය වැළැක්වීමට සමත් විය. ඔවුන්ට විශ්වවිද්‍යාල පරිශ්‍රයට ඇතුළු වීමට පමණක් නොව ප්‍රධාන ගේට්ටුවට පවා හානි කිරීමට නොහැකි විය. අපේ ආරක්ෂක කාර්යය මණ්ඩලය සහ ඊට සහය දුන් අනෙක් සේවක භවතුන් පිළිබඳ මම මේ අවස්ථාවේ මහත් සේ ආඩම්බර වෙමි.

තවද, මෙම විරෝධතාවයට රුහුණ විශ්වවිද්‍යාලයේ හි එකදු අභ්‍යන්තර සිසුවෙක් සහභාගී නොවීය. මම මෙය අගය කරන අතර අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ නියෝගවලට සහය නොදැක්වීමේ අවදානම නොතකා ඒවා කඩ කළ සිසුන් ගැන මම ආඩම්බර වෙමි. ඔවුන්ට රැස් කර ගැනීමට හැකි වූ පිරිස 150කට අඩු පිරිසකි. විශ්වවිද්‍යාලයක පළමු වසර සිසුන් ලෙස පෙනී සිටි ඇතැම් තරුණ භික්ෂූන් වහන්සේලා හැර ඔවුන් බොහෝ දුරට පෙනී සිටියේ විශ්වවිද්‍යාල සිසුන් ලෙස නොවේ. එබැවින්,රුහුණ විශ්වවිද්‍යාලයේදී අ.වි.ශි.බ.ම. දහහතරවන වරටත් දේශපාලනිකව පරාජයට පත් විය.

නමුත් අපගේ ආරක්ෂක කාර්යය මණ්ඩල සාමාජිකයින් කිහිප දෙනෙකුට පහර දීමට ඔවුන්ට හැකි විය. ඉන් එක අයෙකුගේ (ආරක්ෂක පරීක්ෂක සේනාරත්න මහතා) තත්වය බරපතල විය. ඔහුට රෝහල්ගතව ප්‍රතිකාර ලබා ගැනීමට පවා සිදුවිය. අ.වි.ශි.බ.ම. සාමාජිකයින් 20 දෙනෙකු පමණ ඔහු වටකරගෙන ඔහුගේ කැමරාව උදුරා ගැනීමට උත්සාහ දරා ඇත. එසේම ඔහුගෙන් ප්‍රධාන ගේට්ටුවේ යතුර ඉල්ලා අමානුෂික ලෙස පහර දී ඇත. එම ප්‍රහාරය මුළු හදවතින්ම හෙළා දකිමි.

මෙම ප්‍රහාරය අ.වි.ශි.බ.ම. කැඳවුම්කරු වසන්ත මුදලිගේ මහතා, කොළඹ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය සංගමය යැයි හඳුන්වන, සභාපති ෂෙහාන් ශාලින්ද මහතා සහ අන්තර් විශ්වවිද්‍යාල භික්ෂු බල මණ්ඩලයේ කැඳවුම්කරු පූජ්‍ය ගල්වැව සිරිධම්ම හිමි විසින් මෙහෙයවා ඇත. ඔවුන් විසින් බස් රථ තුනකින් සෙනඟ ගෙන එන ලදී. සමහර තරුණ භික්ෂූන් වහන්සේලා හැරුණු විට පිරිසෙන් බහුතරයක් විශ්වවිද්‍යාල සිසුන් බව පෙනෙන්නට තිබුණේ නැත.

CamScanner

සවස 3.00 ට පමණ පළමු බස් රථයේ සිට පැමිණි පිරිස තුලින් සාමකාමී බවක් පෙනෙන්නට තිබූ අතර මාර්ගය දෙපස මීටරයක් දුරින් පුවරු අල්ලා ගැනීමට පටන් ගත්හ. පිරිස 100ට මදක් වැඩි වූ විට අ.වි.ශි.බ.ම. සාමාජිකයන් ප්‍රචණ්ඩකාරී වූ අතර ඔවුන් අසභ්‍ය/අශීලාචාර භාෂාවෙන් පොලිසියට සහ ආරක්ෂක නිලධාරීන්ට වාග් ප්‍රහාර එල්ල කිරීමට කිරීමට පටන් ගත්හ. මුදලිගේ මහතා සහ තවත් දෙදෙනෙක් ප්‍රකෝපකාරී ලෙස කතා කළහ. මගේ උපදෙස් අනුව අපේ ආරක්ෂක නිලධාරීන් දැඩි සංයමයකින් කටයුතු කරන ලදී. ආරක්ෂක නිලධාරීන්ට අමානුෂික ලෙස පහර දුන්නද, ඔවුන් අ.වි.ශි.බ.ම. සාමාජිකයින්ට පහර දුන්නේ නැත. අපගේ ආරක්ෂක නිලධාරීන්ගේ විනය මෙයින් පෙන්නුම් කරන ලදි. නමුත් එය වැළැක්වීමට පොලිස් නිලධාරීන් ක්‍රියා කළේ නැත.

උපකුලපතිට, නියෝජ්‍ය උපකුලපතිට, ප්‍රධාන ආරක්ෂක නිළධාරීට, පොලිසියට සහ රුහුණ විශ්වවිද්‍යාලයේ කාර්යය මණ්ඩල සාමාජිකයින්ට පරිභව කිරීමෙන් පසු ඔවුන් සවස 7.00 ට පමණ එම ස්ථානයෙන් පිටව ගියහ. මෙම සිද්ධිය පිළිබඳව පොලිසියට පැමිණිලි කර ඇත. විද්‍යුත් සාක්ශි මගින් හදුනා ගැනුණු අයට විරුද්ධව නීතිය ක්‍රියාත්මකවනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

මීට අදාළ තවත් සිදුවීම් කිහිපයක්ද වාර්තා විය. අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලය රුහුණ විශ්වවිද්‍යාලය වෙත ඇතුළුවීම වැළැක්වීම සඳහා ප්‍රධාන ගේට්ටුව වසා තබන ලෙස පොලිසිය අපට උපදෙස් දුන් අතර මේ හේතුවෙන් වැඩ නිමවීමෙන් පසු කාර්යය මණ්ඩලයට විශ්වවිද්‍යාල පරිශ්‍රයෙන් පිටතට යාමට නොහැකිව රඳවා තබා ගැනීමට සිදුවිය. මෙය අනපේක්ෂිත දෙයක් වූයේ මුලින් විරෝධතාවය දහවල් 12.00 ට පැවැත්වීමට නියමිතව තිබූ අතර පසුව එය පස්වරු 2.00 ක දක්වා කල් දැමීම නිසාවෙනි. කෙසේ වෙතත්, එය සවස 3.00 ට ආරම්භ විය.

මා අදහස් කරන පරිදි මෙය අ.වි.ශි.බ.ම ඔවුන්ගේ පැත්තේ සංඛ්‍යාව වැඩි කිරීමට ශිෂ්‍යයින් සහ කාර්යය මණ්ඩලය වැඩ නිමවී පිටව යාමට උත්සාහ කරන අවස්ථාවේ සිදුකරන ලද්දක් බවයි. විකල්ප වැඩපිළිවෙලක් ලෙස අපි කාර්යය මණ්ඩලයට ක්‍රීඩා පිටිය හරහා පිට වී යාමට ඉඩ සලසා දුන්නෙමු. කාර්යය මණ්ඩලය සහ සිසුන්ගෙන් 98% කට වඩා වැඩි පිරිසක් මෙම ස්ථානය හරහා පිටව ගියහ. අභ්‍යන්තර ශිෂ්‍යයින් අ.වි.ශි.බ.ම. අනුග්‍රහයක් නොදක්වා ඉවත්ව වන අයුරු අපි දුටුවෙමු. මෙය ඉතා දිරිගන්වන ලකුණක් විය. විරෝධතාකරුවන්ගෙන් මිදී සිසුන් බුද්ධිමත්ව කටයුතු කරන ආකාරය දැකීම අපට මහත් සතුටකි. එය විරෝධතාවයට ඔවුන් දැක්වූ අකමැත්ත තුලින් රුහුණ විශ්වවිද්‍යාලයේ විවෘත හා අඛණ්ඩ අධ්‍යාපනය කෙරෙහි ඇති කැමැත්ත ප්‍රකාශ කළේය.

මානසික සෞඛ්‍ය ගැටලුවක් ඇති එක් අයෙකුගේ නායකත්වයෙන් යුත් තුන්වන වසරේ කළමනාකරණ සිසුන් පිරිසක් රුහුණ විශ්වවිද්‍යාලයේ පරිශ්‍රය තුළ සිට අ.වි.ශි.බ.ම.යේ සටන් පාඨමකියමින් කෑ ගැසූහ. විශ්වවිද්‍යාලය තුළ සිටින සමස්ත සිසුන් 11000කට ආසන්න සංඛ්‍යාවකින් මෙම පිරිස 20කටත් අඩු පිරිසක් විය.

නමුත් අ.වි.ශි.බ.ම සහ පෙරටුගාමී පක්ෂයේ හි ගොදුරු බවට පත් නොවී ඉතා වගකීම් සහගතව කටයුතු කිරීම සම්බන්ධයෙන් රුහුණ විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය ප්‍රජාවට ආචාර කිරීමට සහ ගෞරවය දැක්වීමට මම කැමැත්තෙමි. අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලය රුහුණ විශ්වවිද්‍යාලයේ වෙත ඇතුළු වීම වැළැක්වීමට ආරක්ෂක අංශය ගත් පියවර හා ඔවුන් සතු ධෛර්ය සහ අධිෂ්ඨානය වෙනුවෙන් මම ඔවුන්ට ආචාර කිරීමට කැමැත්තෙමි. ඔවුන්ගේ ඉවසීම, දරා ගැනීමේ හැකියාව, සාමාන්‍ය බුද්ධිය ආදර්ශවත් ය.

අ.වි.ශි.බ.ම. විසින් කරන මෙම විරෝධතා සියල්ල අවසානයේ අරමුනු කර ඇත්තේ පාසල් මට්ටමින් සහ විශ්වවිද්‍යාල මට්ටමින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය කඩාකප්පල් කිරීමයි. නුදුරු අනාගතයේ දී ඔවුන් නැවත නැවතත් පැමිණීමට ඉඩ ඇති අතර අපට එය සමඟ කටයුතු කිරීමට සිදු වන සෑම අවස්ථාවකදීම අද තමන් භුක්ති විඳින ජීවිතයේ නිදහස ආරක්ෂා කර ගැනීම සඳහා අවදියෙන් සිටින ලෙසත් කිසි විටෙකත් එම නිදහස වෙනත් කෙනෙකුගේ දේශපාලන ක්‍රීඩාවකට කැප නොකරන ලෙසත් සියලුම රුහුණ විශ්වවිද්‍යාලයේ සිසුන්ගෙන් ඉල්ලා සිටීමට කැමැත්තෙමි. විශ්වවිද්‍යාල ඉතිහාසයේ හතළිස් වසරක නවක වදය සහ ප්‍රචණ්ඩත්වය දුටු මා, රුහුණ විශ්වවිද්‍යාලයේ හි සමස්ත ප්‍රජාවගේ සහයෝගය ඇතිව මගේ නායකත්වය යටතේ රුහුණ විශ්වවිද්‍යාලය තුළ නිදහස් පරිසරයක් ගොඩනැගීමට හැකිවිය. අද ඔබ එය අත්හැරියොත් කිසිවකුටත් ඒ නිදහස ඔබට නැවත ලබා දීමට නොහැකි වනු ඇත.

2022.05.09 දින අරලියගහ ඉදිරිපිට උද්ඝෝෂකයන්ට පහරදීම හෙළා දකිමින් ඊට එරෙහිව වැඩවර්ජනයකට පවා ගිය සියලුම වෘත්තීය සමිති හා ගුරු සංගම්, අ.වි.ශි.බ.ම. විසින් ආරක්ෂක නිලධාරීන්ට එල්ල කරන ලද මෙම ම්ලේච්ඡ ප්‍රහාරය හෙළා දැක නැත.

අ.වි.ශි.බ.ම දූෂණය, බලය අවභාවිතය, ආර්ථිකයේ අසාර්ථකත්වය සහ ඥාති සංග්‍රහ සඳහා නිසිලෙස තේරී පත් වූ අතිගරු ජනාධිපතිතුමා ගෙදර යන ලෙස ඉල්ලා සිටින අවස්ථාවේ රුහුණ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය පවත්වා

CS CamScanner

ගැනීමට සහ නීතිය හා සාමය ආරක්ෂා කිරීමට පිරිසිදු සහ ඵලදායී ලෙස කටයුතු කරන නිසා උපකුලපතිවරයා ඉවත් වෙන ලෙසත්ය. එම ඉල්ලීම් දෙක හාස්‍යජනක ලෙස දේශපාලනිකව පරස්පරවිරෝධීය.

කෙසේ වෙතත් මා දූෂිතයෙකු බවත්, බලය අයුතු ලෙස භාවිතා කරමින් උපකුලපතිවරයා ලෙස අසමත් වූ බවට කවුරුන් හෝ විශ්වාස කරන්නේ නම්, උපකුලපතිවරයාට වුවද රටේ නීතියට ඉහළින් සිටීමට නොහැකි බැවින් මා ඉවත් කිරීමට අභියාචනාධිකරණයේ හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිමය ක්‍රියාමාර්ග ගත හැකිය. යමෙකුට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට , උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට, අතිගරු ජනාධිපතිතුමාට සාක්ෂි සහිතව පැමිණිලි කළ හැකි නමුත් එම පැමිණිල්ල නිර්නාමික විය නොහැක. මෙම විකල්ප දෙක භාවිතා කිරීමෙන් කෙනෙකුට දූෂිත උපකුලපතිවරයෙකු පද්ධතියෙන් ඉවත් කළ හැකිය. ඉන් සිසුන්ගේ අධ්‍යාපනයට බාධාවක් නොවේ. අ.වි.ශි.බ.ම. මෙම ප්‍රජාතන්ත්‍රවාදී සහ නීතිමය ප්‍රවේශය භාවිතා නොකරයි. මා දූෂිත යැයි විශ්වාස කරන ඕනෑම අයකුට ප්‍රචණ්ඩ ලෙස පාරට බැස උද්ඝෝෂණ කරනවාට වඩා එම ක්‍රමය අනුගමනය කරන ලෙසට ඉල්ලා සිටිමි.

අ.වි.ශි.බ.ම. වත්මන් කැඳවුම්කරු මට විරුද්ධව අල්ලස් කොමිසමට පැමිණිල්ලක් ඉදිරිපත් කරන ලදි. මම එම චෝදනාවලට එරෙහිව සාක්ෂි ඉදිරිපත් කළෙමි. වසන්ත මුදලිගේ මහතාට ප්‍රකාශයක් සටහන් කර ගැනීම සඳහා අල්ලස් කොමිසම කිහිප වතාවක්ම කැඳවූ බව මම දනිමි. නමුත් ඒ සඳහා ඔහු ගියේ නැත. මක්නිසාද යත්, ඔහුගේ පැමිණිල්ල අසත්‍ය බවත්, මෙවා දේශපාලන විජ්ජා බවත් ඔහු දන්නා බැවිනි. පොලිසියට අසත්‍ය පැමිණිල්ලක් කිරීම අධිකරණයේදී ඔප්පු වුවහොත් දණ්ඩ නීති සංග්‍රහයට අනුව වසර හතක සිර දඬුවමක් ලැබේ. ඒ නිසා ඔවුන් කිසිවිටෙක පොලිසියට හෝ අල්ලස් කොමිසමට වාචික ප්‍රකාශ ලබා නොදේ. මෙය අසත්‍ය පැමිණිල්ලක් ලෙස සලකා විමර්ශනය කරන ලෙසට ඉල්ලමින් මම දැනටමත් පොලිස්පතිවරයාට පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබේ. මෙම පැමිණිල්ල තවදුරටත් ඉදිරියට ගෙන යාමට අදහස් කරමි.

මෙම ශ්‍රේෂ්ඨ ආයතනය ආරක්ෂා කිරීමට සහය වීම සම්බන්ධව ඉවසීමෙන් කටයුතු කිරීම සම්බන්ධයෙන් සමස්ත රුහුණ විශ්වවිද්‍යාල ප්‍රජාවටම මම මහත් ගෞරවයෙන් ආචාර කරමි. 2025 දී මගේ ධූර කාලය නීත්‍යානුකූලව අවසන් වන තුරු මෙය නැවත නැවතත් සිදුවිය හැකි බැවින් ඔබ සියලුදෙනා ඉදිරියේදී ද ඉතා විමසිලිමත්ව කටයුතු කරන මෙන් ඉල්ලා සිටිමි.

07. 06. 2022

මහාචාර්ය සුජීව අමරසේන
උපකුලපති

CamScanner